සත්ත්ව ලෝකය

# පච්ච මැණික් පරෙවියා

# Emerald Dore



**පරෙවියා කී සැනින් අපේ සිතට නැගෙන්නේ සාමයේ සංකේතය හඟවන සුදු පරෙවියාගේ රූපයයි. නමුත් විවිධාකාර වූ පරෙවියන්ගේ ප්‍රභේද අතර ඉන්දියාවේදී හමුවන Emerald Doreහෙවත් පච්ච මැණික් පරෙවියාට විශිෂ්ට ස්ථානයක් හිමිවීම අරුමයක් නොවේ.**

Chalocphaps Indicaනමින් හඳුන්වන මෙම පරෙවි විශේෂය අනෙකුත් පරෙවි වර්ග අතර ඉතාම දර්ශනීය මෙන්ම අලංකාර සත්ව විශේෂයක් වන්නේය. දුඹුරු රෝස වර්ණ සහිත මෙම පරෙවියාගේ සිරුරේ ඉහළ කොටස ලෝකඩ වර්ණ කොළ පැහැතිය. සුදු පැහැති නළල සහ ඇස්බැමි පැහැදිලිව පෙනෙන විශිෂ්ට ලක්ෂණය වේ. සෙන්ටිමීටර් 27 ක් පමණ වූ පච්ච මැණික් පරෙවියා ප්‍රමාණයෙන් මයිනාට වඩා ටිකක් විශාල ය. ඉන්දියානු අර්ධද්වීපය පුරා විශාල ව්‍යාප්තියක් පෙන්වන මෙම පරෙවි විශේෂයේ ගැහැණු / පිරිමි ප්‍රභේද හඳුනාගත හැකි විශේෂ ලක්ෂණයක් නැත. නිල්ගිරි, කඳු, නැගෙණහිර මධ්‍ය ප්‍රදේශය හිමාලයා උප අර්ධද්වීපයේ සිට නැගෙනහිර ඇසෑමයේ අඩි 6000 ක් පමණ උස ප්‍රදේශයක් පුරා පච්ච මැණික් පරෙවියාගේ ව්‍යාප්තිය දැක ගන්නට ලැබේ.

**පුන්‍යා චාන්දනී ද සිල්වා**

හුදෙකලාව හැසිරෙන පරෙවියා ගස්, තැනිතලා, බට කැලෑ වල මෙන්ම කඳුරු ආශ්‍රිතව ජීවත්වේ. තනිව මෙන්ම ජෝඩු ලෙස ද දක්නට ලැබෙන පරෙවියන් දූවිලි පාරවල් වල ඇට වර්ග අහුලා කන අතර තේ, කෝපි වගා ආශ්‍රිතව ඇති හෙවන ප්‍රදේශවල ද හැසිරෙති. ඉතාම ඉක්මනට පියඹා යාමේ ශක්තිය ඇති පරෙවියන් එළිමහනේදී හැකි ඉහළම ශක්තියෙන් පියඹා යාමේ ශූරයන් ය. කිසියම් බාධාවක් බව දැණුන විට කැලෑවට ඇතුළු වීමට පෙරාතුව සිය ගමනේ වේගය උපරිම කිරීමට ද පරෙවියාට ශක්තිය ඇත.

ඇට වර්ග ප්‍රධාන ආහාරය සේ සලකන පරෙවියන් නිම්න ප්‍රදේශවල ඇති බෙරි berrie වර්ග සහ වේයන් ද ආහාර කොට ගනිති. නාසයෙන් නගන හඬකට සමාන වූ අවසානයක් ඇති ශබ්දය මෘදු වුවද ගැඹුරුය. මුල්ම වරට ඇසෙන විට එම ශබ්දය තේරුම් ගැනීමට පවා අපහසුය. එය පරෙවියාගේ හඬය යන නිගමනයට එළැඹීමට ටික වේලාවක් ගතවේ.

ප්‍රාදේශීය කාලගුණ තත්ත්වයන්ට අනුව ප්‍රජනන කටයුතු සිදුවේ. දකුණු ඉන්දියාවේ පරෙවියන්ගේ ප්‍රජනන කාලය ජනවාරි සහ පෙබරවාරි වේ. හිමාලයා ප්‍රදේශයේ දී මාර්තු සිට ජූනි වේ. ඔවුන්ගේ කූඩු ඉතාම ඉක්මනින් කැඩෙන සුළුය. ගසෙක පහළ කොටසේ හෝ උණ පඳුරුවල බිත්තර වපම සඳහා කූඩු සාදන අතර එම කූඩුවෙන් පොළව මට්ටමේ සිට අඩි 5 - 10 අතර සීමාවක වේ. වරකට බිත්තර දෙකක් පමණ දමන අතර ඉලිප්සාකාර හැඩැති මෙම බිත්තර දීප්තිමත් සුදු පැහැයෙන් යුක්තය.

සාමයේ සංකේතය ලෙසින් මනසට ලබාදෙන විවේකයට අමතරව ඉන්දියාවේ පච්ච මැණික් පරෙවියා මනසට ලබාදෙන ආකර්ශනය ගැන ද අමතක කළ යුතු නැත.

*India Perspective* ඇසුරිනි